WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. **විකෘති** නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) විකෘති නාට්‍යය කවර සියවසේ කවර දශකයේ දී නිර්මාණය වූවක් ද? (ලකුණු 02 යි)
   (ii) තිරය විවර වීමත් සමග ම එම නාට්‍යයේ ප්‍රේක්ෂකයා දකින දර්ශනය කුමක් ද? (ලකුණු 02 යි)
   (iii) ප්‍රියංගනී පාසල් විෂයයන් අතර වඩාත් දක්ෂතාවක් දක්වන්නේ කවර විෂයකට ද? (ලකුණු 02 යි)
   (iv) ප්‍රියංගනී ගේ අපේක්ෂා වෙනත් මඟකට යොමු කරනු ලබන්නේ කවුරුන් විසින් ද? එම චරිතයේ නම කුමක් ද? (ලකුණු 02 යි)
   (v) නාට්‍යය අවසානය වන විට ප්‍රියංගනී ගේ චරිත ස්වභාවය කවර ආකාර වේ ද? (ලකුණු 02 යි)
   (vi) මෙම නාට්‍යයෙන් ඉදිරිපත් කෙරෙන්නේ කවර අදහසක් ද? (ලකුණු 02 යි)

2. (i) ප්‍රාසංගික කලාව යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
   (ii) නාට්‍යය හැර සෙසු ප්‍රාසංගික කලා **තුනක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) සෙසු ප්‍රාසංගික කලාවනට වඩා නාට්‍ය කලාවෙහි ඇති විශේෂත්වය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) නාට්‍යයක ගැටුම යන්න පහදන්න. (ලකුණු 02 යි)
   (ii) ගැටුම ප්‍රභේද කර දක්වන්න. (ලකුණු 04 යි)
   (iii) ඔබ නැරඹූ ප්‍රසිද්ධ නාට්‍යයක් ඇසුරෙන් ගැටුම් ප්‍රභේද දැක්වෙන අවස්ථා නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. ප්‍රොසීනියම් රංග භූමියේ භූගෝලීය බෙදීම මෙන් ම දෘෂ්ටි රේඛාව ද මනඃකල්පිත වේ.
   (i) රංග භූමිය කොටස් කීයකට බෙදා දැක්වේ ද? (ලකුණු 02 යි)
   (ii) එම බෙදීම් රූපසටහනක් ඇඳ නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) රංග භූමිය ප්‍රායෝගික ව භාවිත කිරීමේ දී දැනගත යුතු කරුණු **හයක්** ලියන්න. (ලකුණු 06 යි)

WWW.OLEVELAPI.COM

5. (i) මඩු ශාන්තිකර්ම වඩාත් ප්‍රචලිත පලාත කුමක් ද? (ලකුණු 02 යි)
   (ii) මඩු ශාන්තිකර්ම **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
   (iii) මඩු ශාන්තිකර්මයක නාට්‍යමය අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 07 යි)

6. (i) මුල් ම සිංහල නූර්තිය නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) නූර්ති රචකයන් දෙදෙනකු නම් කර ඔවුන් ගේ නූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) නූර්තිහි රංග ශෛලිය විස්තර කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කතා සැකිල්ල ඔබට කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහි දී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කරගත හැකි ය.

   "පාසල් නිවාඩු දිනයේ දී නාට්‍ය පුහුණුව පිණිස මුලින් ම පාසලට පැමිණෙන්නේ සෙව්වන්දි, හංසිකා හා චමිත් ය. ඔවුහු එකිනෙකා සමග සුහද කතාවක යෙදෙමින් සිටියදී පාසල් පිට්ටනිය දෙසින් නැගුණු යාන්ත්‍රික හඬක් ඇසී එදෙස බලති. අවට ලෝකය තුළ කෙදිනක හෝ නොදුටු ආකාරයේ යානයකින් එළියට බැසගත් සුවිශේෂී පෙනුමකින් යුත් ප්‍රමාණයෙන් උස අඩු ජීවීන් දෙදෙනකු ඔවුන් දෙස බලා සිටිනු දකිති."

   (i) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ලකුණු 04 යි)
   (ii) සංවාද හා රංග විධාන සහිත ව පෙළ රචනා කිරීම සඳහා (ලකුණු 08 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...